---

## ලුණුගල ප්‍රාදේශීය සභාව
## බදුල්ල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 13 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 17 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 16 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ලුණුගල ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමට බැරවිය යුතු කර්මාන්ත තිස් තුනක රැඳවුම් මුදල් රු.995,059 ක් කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, ණයහිමි ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) අන්තර් ගම්මාන නියමු ව්‍යාපෘතියේ ජංගම ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට පැවැති රු.8,298,803 ක මුදල් ශේෂය සභා අරමුදල් ගිණුමේ ශේෂයක් සේ සලකා ගිණුම් තැබීම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සභාව සතු ගොඩනැගිලි හතරක වටිනාකම් තකසේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් ජල ව්‍යාපෘති තුනක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරි ජල ගබඩා තොගයේ වටිනාකම වූ රු.73,935 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් තැබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දෙසැම්බර් 31 දිනට ඉතිරි ජල ගබඩා තොගයේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,887,466 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 588,909 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් මාස නමයක කාල පරිච්ඡේදයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 390,300 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 59 | 322 | 561 |
| (ii) | බදු කුලී | 2,585 | 2,007 | 972 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 953 | 548 | - |
| (iv) | වෙනත් ආදායම් | 11,364 | 24,634 | 6,497 |

#### 2.2.2 වරිපනම් බදු

2004 වර්ෂයේ දී කරන ලද තක්සේරුව පදනම් කරගෙන 2012 වර්ෂය සඳහා ද වරිපනම් බදු අයකරමින් පැවතුනි.

---

2.2.3 **බදු කුලී**

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන අනුව කඩ කාමර වසර පහකට වරක් වත් නැවැත තක්සේරු කළ යුතු වුවද ලුණුගල වෙළඳපොල කඩ කාමර 12 ක් වසර පහකට වරක් තක්සේරු කර නොතිබුණ අතර, විටින් විට සභාව මඟින් කුලී සංශෝධනය කර අයකරමින් පැවැතුණි.

2.2.4 **බලපත්‍ර ගාස්තු**

(අ) සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර අයකර ගත යුතු වෙළඳ ආයතන හඳුනාගැනීම සඳහා වර්ෂය ආරම්භයේ දී වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) ගෝඝාතකාගාරය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුව පාරිසරික අමාත්‍යවරයා විසින ප්‍රකාශයට පත්කරන ලද අංක 1159/22 හා 2000 නොවැම්බර් 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ "අ" උපලේඛණය අනුව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු පරිසර බලපතය ලබාගෙන නොතිබුණි.

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,232,290 |
| (ii) | මුද්දර ගාස්තු | 276,815 |

2.3 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

2011 දෙසැම්බර් 31 දින පස්සර ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබුණ අත්ට්‍රැක්ටරය සභා භූමිය තුල නිෂ්ක්‍රියව පැවතුනි.

2.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය 1 පන්තියේ නිත්‍ය තනතුරක් දරන වැඩ බලන ලේකම්වරයාට ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 12:5:2 වගන්තියට පටහැනිව වැඩ බැලීමේ වැටුප ගණනය කිරීමෙන් රු.44,587 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සභාවට අයත් ෂෝලන්ඩ්ස් ජල යෝජනා ක්‍රමය මගින් ලබාදී ඇති ජල සම්බන්ධතා 741 ක් සඳහා ජල මනු සවි නොකර මාසිකව රු.50 සිට රු.2,000 දක්වා ස්ථාවර ගස්තුවක් අයකරමින් පැවතුනි.

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අවස්ථා 215 කදී අයකරගන්නා ලද එකතුකළ අගය මත බදු රු.40,074 ක 2013 ජුනි 21 දින වන විටත් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක නොකරන අතර, සභා භූමිය තුලට අක්‍රමවත්ව කැලි කසල බැහැර කරමින් පැවතුනි.

## 3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය